(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක. 443.]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

**2015 මාර්තු මස 19 වැනි බ්‍රහස්පතින්දා අ. භා. 1.00 ට**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

4323/'13

1.

ගරු බුද්ධික පතිරණ මහතා,— සංචාරක හා ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) මොල්ලිකුලම් - සිලාවතුර මාර්ගය ඉදිකිරීම සඳහා අවශ්‍ය බොරලු ලබා ගැනීමට මහා පරිමාණයේ බොරලු කැපීමක් විල්පත්තු ජාතික වනෝද්‍යානයේ, කලාප අංක 4 ට අයත් බොරලුවල ප්‍රදේශයේ සිදු කරන බවත්;

(ii) තන්තිරිමලේ වන අඩවි කාර්යාලයේ අඩවි ආරක්ෂක නිලධාරියාගේ අනුග්‍රහය මේ සඳහා ලැබෙන බවට ප්‍රදේශයේ ජනතාව චෝදනා කරන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) 1937 අංක 02 දරන වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනතේ 3, 5, 6 වගන්ති සියල්ලම ඉහත (අ) (i)හි සඳහන් ක්‍රියාව නිසා උල්ලංඝනය වන බව පිළිගන්නේද;

(ii) එසේ නම්, මාග ඉංජිනේරු පුද්ගලික සමාගමට ඉහත ප්‍රදේශයේ බොරලු කැපීම සඳහා නිර්දේශ ලබා දුන් අය කවුරුන්ද;

(iii) විල්පත්තු ජාතික වනෝද්‍යානයේ පරිසරයට විශාල හානියක් වන එම ක්‍රියාවලිය වහාම නතර කිරීම සඳහා කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4789/'14

2.

ගරු අශෝක් අබේසිංහ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ප්‍රතිපත්ති සම්පාදන, ආර්ථික කටයුතු, ළමා, තරුණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාව තුළ පිහිටුවා ඇති සංස්කෘතික මධ්‍යස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ පිහිටුවා ඇති සංස්කෘතික මධ්‍යස්ථාන සංඛ්‍යාව කොපමණද;

(iii) සංස්කෘතික මධ්‍යස්ථාන පිහිටුවීමේ ක්‍රමවේදය කවරේද;

(iv) සංස්කෘතික මධ්‍යස්ථාන භාර නිලධාරීන්ට ගෙවනු ලබන දීමනාව කොපමණද;

(v) එම දීමනාව වැඩි කිරීම සඳහා වැඩපිළිවෙළක් තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5337/'14

3\.

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා,— අභ්‍යන්තර ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2013 වර්ෂය තුළදී ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය (ශ්‍රී ලංගම) සතු වූ ධාවනයට සුදුසු මුළු බස් රථ සංඛ්‍යාව කොපමණද;

(ii) එම වර්ෂය තුළදී ධාවනයට නුසුදුසුයැයි ධාවනයෙන් ඉවත් කළ ශ්‍රී ලංගම බස් රථ සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) වර්තමානයේ ශ්‍රී ලංගම නමින් ධාවනයට යොදවා ඇති පුද්ගලික බස් රථ සංඛ්‍යාව කොපමණද;

(ii) එම බස් රථ යොදවා ඇති ගමනාන්තයන් කවරේද;

(iii) එම බස් රථ ශ්‍රී ලංගමයට එක් කර ගැනීමට අනුගමනය කළ අනුමත කරන ලද ක්‍රමවේදය කවරේද;

(iv) එම බස් රථ මගින් ශ්‍රී ලංගමයට ආදායම ලබා ගන්නා ආකාරය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5690/'14

4\.

ගරු අනුර දිසානායක මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2013 වර්ෂයේ සිට 2014 අගෝස්තු මාසය දක්වා කාල සීමාව තුළ පැල්වත්ත හා සෙවණගල සීනි සමාගම් විසින් නිෂ්පාදනය කරන ලද මුළු එතනෝල් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම එතනෝල් ප්‍රමාණයෙන් මත්පැන් නිෂ්පාදනයට හා සුවඳ විලවුන් නිෂ්පාදනයට යොදාගත් ප්‍රමාණයන් එක් එක් වර්ෂය අනුව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) මත්පැන් හා සුවඳ විලවුන් නිෂ්පාදන වෙනුවෙන් ලීටරයකට අය කරනු ලබන බදු ප්‍රමාණයන් කොපමණද;

(iv) එම එතනෝල් ලබා ගත් මත්පැන් නිෂ්පාදන සමාගම්වල හා සුවඳ විලවුන් නිෂ්පාදන සමාගම්වල නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5708/'14

5\.

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— නිවාස හා සමෘද්ධි අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2011 දැයට කිරුළ වැඩසටහනට සමගාමීව 2011 ජන සෙවණ නිවාස දස ලක්ෂය නිවාස සහ ජනාවාස මෙහෙයුම යටතේ මොණරාගල දිස්ත්‍රික්කය තුළ නිවාස පහසුකම් ලබාදීමට හඳුනාගත් මුළු පවුල් සංඛ්‍යාව කොපමණද;

(ii) එකී යෝජනා ක්‍රමය යටතේ නිවාස පහසුකම් ලබාදුන් පවුල් සංඛ්‍යාව කොපමණද;

(iii) එම යෝජනා ක්‍රමය සඳහා වැය කළ මුදල් ප්‍රමාණය කොපමණද;

(iv) එකී මුදල් ලබා ගත් ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) 2011 ජන සෙවණ නිවාස දස ලක්ෂය නිවාස සහ ජනාවාස මෙහෙයුම යටතේ නිවාස පහසුකම් ලබාදීමට හඳුනාගත් පවුල් වෙත ලිඛිත පොරොන්දුවක් ලබා දී තිබුණේද;

(ii) එකී පොරොන්දුව අනුව මෙතෙක් නිවාස ලැබී නොමැති පවුල් සඳහා නිවාස ලබා දීමට පියවර ගන්නේද;

(iii) ඒ සඳහා ගත වන කාලය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5845/'14

6.

ගරු මොහමඩ් අස්ලම් මහතා,— රාජ්‍ය පරිපාලන, පළාත් සභා, පළාත් පාලන හා ප්‍රජාතාන්ත්‍රීය පාලනය පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) කොළඹ මහ නගර සභා බල ප්‍රදේශයේ, අංක 32, කුප්පියාවත්ත බටහිර කොට්ඨාසයට අයත්, හික්කඩුව ශ්‍රී සුමංගල හිමි මාවතේ, වරිපනම් අංක 108 සහ 108/20 දරන ස්ථානයන්ට ප්‍රවේශ වන මාර්ගයට බාධා වන අයුරින්, නාගරික පොදු වැසිකිළි පද්ධතිය මත අනවසර ඉදිකිරීමක් සිදුකොට තිබෙන බව එතුමා දන්නෙහිද?

(ආ) කොළඹ මහ නගර සභාවේ ඇතැම් නිලධාරීන්ගේ අනුග්‍රහය මත සිදු කරන ලද එකී අනවසර ඉදිකිරීම් නිසා පොදු වැසිකිළි පද්ධතිය පුද්ගලික දේපළක් බවට පත්වී තිබෙන හෙයින්, එම ඉදිකිරීම් නොපමාව ඉවත් කිරීමට පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5862/'15

7.

ගරු ශාන්ත බණ්ඩාර මහතා,— මහාමාර්ග, උසස් අධ්‍යාපන හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාර්ග පද්ධතියේ ඇති දියුණුව අප රටේ සංවර්ධනයට බලපාන ප්‍රධාන සාධකයක් වන බවත්;

(ii) පසුගිය වර්ෂ කිහිපය තුළ මෙරට මාර්ග සංවර්ධන කටයුතු රැසක් සිදු වූ බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) මේ වන විට අතරමග නැවතී ඇති මාර්ග සංවර්ධන ව්‍යාපෘති සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5875/'15

8.

ගරු ලලිත් දිසානායක මහතා,— මහජන සාමය, ආපදා කළමනාකරණය හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015 ජනවාරි මස 08 වැනි දින පවත්වන ලද ජනාධිපතිවරණයෙන් පසු දිවයිනේ සියලුම පොලිස් වසම්වලින් වාර්තා වී ඇති දේශපාලන ප්‍රචණ්ඩ ක්‍රියා සංඛ්‍යාව කොපමණද;

(ii) එම ප්‍රචණ්ඩ ක්‍රියාවලින් මියගිය පුද්ගලයින් සංඛ්‍යාව කොපමණද;

(iii) ඉහත සඳහන් දේශපාලන ප්‍රචණ්ඩ ක්‍රියා සම්බන්ධයෙන් වන පැමිණිලි අතරින් නිවාස ගිනිතැබීම්වලට අදාළ පැමිණිලි සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4473/'13

9\.

ගරු බුද්ධික පතිරණ මහතා,— රාජ්‍ය පරිපාලන, පළාත් සභා, පළාත් පාලන හා ප්‍රජාතාන්ත්‍රීය පාලනය පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) මාතර, උයන්වත්ත ක්‍රීඩාංගනය දිස්ත්‍රික් සහ සමස්ත ලංකා මට්ටමේ ක්‍රීඩා තරග පැවැත්වීමට යොදා ගන්නා පොදු ක්‍රීඩාංගනයක් බවත්;

(ii) මාතර නගරවාසීන් බොහෝ පිරිසක් දෛනිකව ශාරීරික සුවතා සඳහා එම ක්‍රීඩාංගනය භාවිතා කරන බවත්;

(iii) මාතර මහ නගර සභාව මගින් එම ක්‍රීඩාංගනය ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයට විකිණීම සඳහා කටයුතු කරමින් සිටින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම ක්‍රීඩාංගනය ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයට විකුණනු ලැබුවහොත්, එම ප්‍රදේශයේ ජනතාවට අපහසුතා රැසකට මුහුණදීමට සිදු වන බව පිළිගන්නේද;

(ii) එසේ නම්, එකී ක්‍රීඩාංගනය විකිණීමේ ක්‍රියාවලිය නවතාලීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4790/'14

10\.

ගරු අශෝක් අබේසිංහ මහතා,— සමාජ සේවා, සුබසාධන හා පශු සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ග්‍රාමීය වැඩිහිටි කමිටු පිහිටුවීම සඳහා ක්‍රමවේදයක් ක්‍රියාත්මක වේද;

(ii) මේ දක්වා පිහිටුවා ඇති ග්‍රාමීය වැඩිහිටි කමිටු සංඛ්‍යාව කොපමණද;

(iii) කුරුණෑගල දිස්ත්‍රික්කයේ පිහිටුවා ඇති ග්‍රාමීය වැඩිහිටි කමිටු සංඛ්‍යාව කොපමණද;

(iv) එම වැඩිහිටි කමිටු සඳහා රජයෙන් ප්‍රතිපාදන සහ භෞතික සම්පත් ලබා දෙන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

5434/'14

11\.

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2014 වර්ෂයේදී ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් තම නිෂ්පාදනවලට අදාළ ප්‍රචාරණ කටයුතු සිදු කිරීම සඳහා ට්‍රැඩ් ලංකා පුද්ගලික සමාගම වෙත කොන්ත්‍රාත්තුවක් ලබා දුන්නේද;

(ii) එසේ නම්, එම කොන්ත්‍රාත්තුවේ වටිනාකම කොපමණද;

(iii) එම ආයතනය වෙත එකී කොන්ත්‍රාත්තුව ලබාදීමේදී පිළිගත් ටෙන්ඩර් ක්‍රියාමාර්ග අනුගමනය කර තිබේද;

(iv) ටෙන්ඩර් කැඳවීමක් සිදු කළේ නම්, මිල ගණන් ඉදිරිපත් කර තිබූ ආයතන හා අදාළ මිල ගණන් කවරේද;

(v) එම මිල ගණන් කැඳවීම් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ කුමන අංශයේ කුමන නිලධාරියා විසින් සිදු කරනු ලැබුවේද;

(vi) ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව තුළ එසේ කටයුතු කිරීම සඳහා ඔවුන්ට නීත්‍යානුකූල බලයක් තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉහත අ (i) හි සඳහන් කොන්ත්‍රාත්තුව ටෙන්ඩර් කැඳවීමකින් තොරව ලබා දී තිබේ නම්, එම ආයතනය තෝරා ගත් පදනම කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

5691/'14

12.

ගරු අනුර දිසානායක මහතා,— මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පසුගිය වර්ෂ තුන තුළදී ශ්‍රී ලංකාවට ආනයනය කරන ලද මුළු එතනෝල් ප්‍රමාණය වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) මත්පැන් නිෂ්පාදනය වෙනුවෙන් හා සුවඳ විලවුන් නිෂ්පාදනය වෙනුවෙන් එතනෝල් ආනයනයේ දී අයකරනු ලබන බදු ප්‍රමාණයන් කවරේද;

(iii) පසුගිය වර්ෂ 03 තුළ ආනයනය කරන ලද එතනෝල්වලින් නිෂ්පාදනය කරන ලද මත්පැන් හා සුවඳ විලවුන් නිෂ්පාදන ප්‍රමාණයන් වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) මත්පැන් නිෂ්පාදනය සඳහා සහ සුවඳ විලවුන් නිෂ්පාදනය සඳහා එතනෝල් ආනයනය කළ සමාගම්වල නම් වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

4791/'14

13.

ගරු අශෝක් අබේසිංහ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ ප්‍රතිපත්ති සම්පාදන, ආර්ථික කටයුතු, ළමා, තරුණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ ලියාපදිංචි වී ඇති පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන සංඛ්‍යාව එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව, වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා සභාගත කරන්නෙහිද?

(ආ) (i) කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ සිටින පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන පාලිකාවන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාලිකාවන් සඳහා දීමනා ලබා දීමේ වැඩ පිළිවෙළක් තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

4821/’14

14\.

ගරු බුද්ධික පතිරණ මහතා,— සංචාරක හා ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2017 වර්ෂයේ දී හම්බන්තොට දී පැවැත්වීමට යෝජිත කණිෂ්ඨ ආසියානු ක්‍රීඩා උළෙල (Junior Asian Games) වෙනුවෙන් සිදුකරන නව ඉදිකිරීම් හා ප්‍රතිසංස්කරණ වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) එම ඉදිකිරීම් හා ප්‍රතිසංස්කරණ සඳහා ඇස්තමේන්තුගත සමස්ත වියදම කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉහත (අ) (i) හි සඳහන් ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව සඳහා අයදුම් කළ ආයතනයන්හි නම්, ලිපිනයන් හා දුරකතන අංක වෙන් වෙන් වශයෙන් එතුමා සභාගත කරන්නෙහිද?

(ඇ) (i) ඉහත (ආ)හි සඳහන් ආයතන අතරින් ඉදිකිරීම් කටයුතු සඳහා තෝරා ගත් ආයතනය කවරේද;

(ii) එම ආයතනය තෝරා ගැනීමට හේතු කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

5435/’14

15\.

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2014 ජනවාරි සිට ජුනි දක්වා ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් දේශීය සැපයුම්කරුවන්ගෙන් මිලදී ගෙන ඇති තාර බැරල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම තාර ප්‍රමාණය මිලදී ගැනීමට වැය කළ මුදල කොපමණද;

(iii) එම තාර බැරල් සියල්ල අලෙවි කිරීමට සුදුසු තත්ත්වයෙන් පැවතියේද;

(iv) නොඑසේ නම්, අලෙවි කිරීමට සුදුසු තත්ත්වයේ තිබූ තාර බැරල් සංඛ්‍යාව කොපමණද;

(v) එම තාර බැරල් විකිණීමෙන් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව ලැබූ ලාභය හෝ අලාභය කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ඉහත සඳහන් තාර සැපයූ ආයතනය තෝරා ගැනීමට අනුගමනය කළ පිළිගත් ක්‍රමවේදය කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) 2013 වර්ෂයේ ජනවාරි සිට දෙසැම්බර් දක්වා තාර බැරල් අලෙවි කිරීමට අදාළව ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට මේ දක්වා අයවීමට ඇති මුදල කොපමණද;

(ii) අය විය යුතු එම මුදල් ප්‍රමාණය එක් එක් ආයතනය අනුව, වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

# ප්‍රධාන කටයුතු ආරම්භයේ දී

## යෝජනා පිළිබඳ දැනුම්දීම

1.

පාර්ලිමේන්තුවේ සභානායකතුමා,— පාර්ලිමේන්තුවේ රැස්වීම්,— ස්ථාවර නියෝග අංක 7හි විධිවිධානවල සහ 2010.07.09 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවේ කුමක් සඳහන්ව තිබුණද, අද දින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව අ. භා. 1.00 සිට අ. භා. 7.30 දක්වා විය යුතු ය. අ. භා. 4.30ට ස්ථාවර නියෝග අංක 7(5) ක්‍රියාත්මක විය යුතු ය.

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*1.

අපරාධ නඩු විධාන සංග්‍රහය (විශේෂ විධිවිධාන) පනත යටතේ නියමය,— විවාදය කල් තබන ලද ප්‍රශ්නය (2015 මාර්තු 17),— "2013 අංක 2 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය (විශේෂ විධිවිධාන) පනතේ 7(2) වගන්තිය යටතේ අධිකරණ හා කම්කරු සබඳතා අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2015 පෙබරවාරි 02 දිනැති අංක 1900/3 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2015.02.20 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය." යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

*2.

මුදල් අමාත්‍යතුමා,— මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියෝගය,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) වැනි ව්‍යවස්ථාව සමග කියවිය යුතු, 2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනතේ 3 වැනි වගන්තිය යටතේ මුද්දර ගාස්තු සම්බන්ධයෙන් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2014 සැප්තැම්බර් 30 දිනැති අංක 1882/17 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2014.12.12 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*3.

විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා විදුලිබල පනත යටතේ නියෝග,— ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභාවේ නිර්දේශ මත 2009 අංක 20 දරන ශ්‍රී ලංකා විදුලිබල පනතේ 54 වැනි වගන්තිය යටතේ විදුලිබල හා බලශක්ති අමාත්‍යවරිය විසින් සාදන ලදුව, 2014 ඔක්තෝබර් 10 දිනැති අංක 1883/12 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2014.11.24 දින ඉදිරිපත් කරන ලද නියෝගය (විදුලිබල පරීක්ෂකවරුන්ගේ කාර්යය, කර්තව්‍ය හා කාර්යපටිපාටි) අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*4.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 1),— 2011.09.07 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ අන්‍යෝන්‍ය වශයෙන් සුරක්ෂණය පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ කුවේට් රාජ්‍යයේ ආණ්ඩුව අතර 2009 නොවැම්බර් මස 05 වැනි දින අත්සන් කරනු ලැබුවාවූ ද, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත්තාවූ ද ගිවිසුම, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍යවන්නක් ලෙස අනුමත කළ යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*5.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 2),— 2011.09.07 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ සුරක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ වියට්නාම සමාජවාදී ජනරජයේ ආණ්ඩුව අතර 2009 ඔක්තෝබර් මස 22 වැනි දින අත්සන් කරනු ලැබුවාවූ ද, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත්තාවූ ද ගිවිසුම, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍යවන්නක් ලෙස අනුමත කළ යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*6.

විදේශ කටයුතු අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 3),— 2014.08.05 වැනි දින ඉදිරිපත් කරන ලද ආයෝජන ප්‍රවර්ධන සහ අන්‍යෝන්‍ය වශයෙන් සුරක්ෂණය පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ චෙක් ජනරජයේ ආණ්ඩුව අතර 2011 මාර්තු මස 28 වැනි දින අත්සන් කරනු ලැබුවාවූ ද, එම විදේශ රාජ්‍යයේ හෝ එහි වැසියන්ගේ හෝ ඒ රාජ්‍යයේ නීති යටතේ සංස්ථාගත කරන ලද නැතහොත් සංස්ථාපනය කරන ලද සංස්ථාවල, සමාගම්වල හෝ වෙනත් සංගම්වල ශ්‍රී ලංකාව තුළ ආයෝජන වඩාලීම හෝ ආරක්ෂා කිරීම සඳහා ඇති කරගත්තාවූ ද ගිවිසුම, ජාතික ආර්ථිකයේ වර්ධනයට අත්‍යාවශ්‍යවන්නක් ලෙස අනුමත කළ යුතුයැයි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 157 වැනි ව්‍යවස්ථාව ප්‍රකාර මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*7.

අභ්‍යන්තර ප්‍රවාහන අමාත්‍යතුමා,— මෝටර් වාහන පනත යටතේ නියෝග,— (203 වැනි අධිකාරය වූ) මෝටර් වාහන පනතේ 5 වැනි වගන්තියේ (2) වැනි උපවගන්තිය සහ 19 වැනි වගන්තිය සමග කියවිය යුතු, එකී පනතේ 237 වැනි වගන්තිය යටතේ ප්‍රවාහන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2013 ජූලි 31 දිනැති අංක 1821/31 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2013.11.22 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*8.

ඉඩම් අමාත්‍යතුමා,— හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ නියෝග,— 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනතේ 60 සහ 62 වැනි වගන්ති සමඟ කියවිය යුතු, එකී පනතේ 67 වැනි වගන්තිය යටතේ ඉඩම් සහ ඉඩම් සංවර්ධන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2009 අගෝස්තු 24 දිනැති, අංක 1616/23 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2010.05.06 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*9.

සංචාරක හා ක්‍රීඩා අමාත්‍යතුමා,— වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනත යටතේ නියමය,— (469 වැනි අධිකාරය වූ) වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනතේ 2 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2011 දෙසැම්බර් 06 දිනැති අංක 1735/21 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2011.12.13 දින ඉදිරිපත් කළ නියමය අනුමත කළ යුතු ය.

*10.

කාලාවරෝධ (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය. (2014 අගෝස්තු 07) [1].

*11.

පතල් හා ඛනිජ ද්‍රව්‍ය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

12.

ශ්‍රී ලංකා කාන්තා සම්මේලනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

13.

රණ කලා ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

14.

ද ඉන්ස්ටිටියුට් ඔෆ් සර්ටිෆයිඩ් පබ්ලික් එකවුන්ටන්ට්ස් (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

15.

මෙඩිසිනා ඕල්ටනේටිවා ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — සලකා බැලීම.

16.

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනත් කෙටුම්පත — සලකා බැලීම.

17.

අල් ජමියාතුල් හ්හව්සියා (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

18.

ශ්‍රී ලංකා ඉදිකිරීම් කර්මාන්ත මණ්ඩලය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**

---

**[1]**

"පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතුය" යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

---